# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,921/6 — 1970 සැප්තැම්බර් 4 වැනි සිකුරාදා — 1970.9.4

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

## පළාත් පාලන නිවේදන

ඇල්.ඩී.—බී. 42/57

### මහා නගර සභා ආඥාපනත

### 277 වැනි වගන්තිය යටතේ ආඥාව

මහනුවර මහා නගර සභාව වෙත පැවරුණු යුතුකම් ඉටු කිරීමට ඒ මහා නගර සභාව සුදුසු තත්ත්වයක නොපවතින බැව් හා එම යුතුකම් ඉටු කිරීම නිරන්තරයෙන් ම පැහැර හැරීම සිදු කරන බැව් මා හට පෙනී යන හෙයින්, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති පීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, 1959 අංක 12 දරන පනතින් හා 1968 අංක 42 දරන පනතින් සංශෝධිත (252 වෙනි අධිකාරය වන) මහා නගර සභා ආඥා පනතෙහි 277 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 1970 සැප්තැම්බර් මස 5 වැනි දින එකී මහා නගර සභාව විසුරුවා හැරිය යුතු ලෙස හා අවලංගු වූ ලෙස මේ ආඥාවෙන් නියම කරමි.

පීf. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති.

1970 සැප්තැම්බර් මස 3 දින.
කොළඹ දී ය.

9–438


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතියේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

602/5——ජේ 16514—5,500 (70/9)